ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන දැන්වීමයි

<u>ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම</u>

ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහත ග්‍රාම නිලධාරී වසම තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ලෙස වසම තුළ ක්‍රියාත්මක ලියාපදිංචි අනුමත ප්‍රජා පාදක සංවිධාන වෙත කරනු ලබන දැනුම්දීමයි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී වසම | ප්‍රතිපාදන ලැබෙන ආයතනය | වැඩ වටිනාකම |
|---|---|---|---|---|
| 1 | බෝපැත්ත කනත්ත වත්ත මාර්ගය සිරිසේන මහතාගේ නිවස අසල සිට කොන්ක්‍රීට් කිරීම | බෝපැත්ත | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 521,700.00 |
| 2 | බෝපැත්ත රයිස් ග්‍රවුන්ඩ් පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම | බෝපැත්ත | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 236,496.13 |
| 3 | පලිගල බොරළුව ජල ව්‍යාපෘතිය ජලනල එලීම (අදියර ii) | පලිගල | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 528,095.00 |
| 4 | හිඳුරංගල ගල්පුරන මාර්ගය කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීම | හිඳුරංගල | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 577,815.31 |
| 5 | මාහිංගොඩ අනුලා භික්ෂුණී ආරාමයට යන මාර්ගය සංවර්ධනය කිරීම | මාහිංගොඩ | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 522,000.00 |
| 6 | ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරයේ බර්නර් එක අලුත් වැඩියා කිරීම | විලේගොඩ | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 200,000.00 |
| 7 | යකුදාගොඩ ග්‍රාමනිලධාරී වසමේ යාය පාරේ මහේෂ් මහතාගේ නිවස අසල සිට කරුණාපාල මහතාගේ නිවස දක්වා අබලන් කොටස සංවර්ධනය කිරීම | යකුදාගොඩ | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | 573,000.00 |
| 8 | බටහිර කලටුවාව හල්දොල පාර උපාලිසේනාරත්න මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම | බටහිර කලටුවාව | සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 1,330,550.00 |
| 9 | පලිගල බොරළුව මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම | පලිගල | සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 1,527,000.00 |
| 10 | පොල්වත්ත පන්සල අසල සිට රංජි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | ඇහැලියගොඩ වත්ත | සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 432,000.00 |
| 11 | වැව්ල පංසල අසල අලුබෝවිල ලාගම හරහා කලා ගම්මාන මාර්ගයේ ගුණසේකර මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම | උතුරු කරදන | සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 1,072,950.00 |
| 12 | දකුණු කරදන යටිපව්ව පන්කඩේ අසල අඩි පාලම කඩා ඉවත් කිරීම | දකුණු කරදන | ප්‍රාදේශී ලේකම් කාර්යාලය | 350000.00 |

02. මෙමප කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට අපේක්ෂා කරන සමිතිවල සභාපති හෝ ලේකම් යන නිලධාරීන්ගෙන් එක් අයෙකු පහත ලිපි ලේඛන ද , රැගෙන 2026.07.07... දිනට පෙර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැමිණ භාරදිය යුතුය.

i. අදාල ප්‍රජා පාදක සංවිධානයේ ඉල්ලීම් ලිපිය හා ලියාපදිංචි සහතිකය

ii.සභාපති , ලේකම්, නමින් ව්‍යාපෘතියේ වටිනාකමද ඇතුළත්ව ප්‍රජා පාදක සංවිධානය ලියාපදිංචි ආයතනය මඟින් නිකුත් කරනු ලබන හැකියා සහතිකය.

iii.සමිතියේ මූල්‍ය තත්වය තහවුරු කර ගැනීම සඳහා අදාල නිල බැංකු ගිණුමේ පසුගිය අවසන් මාසයට යාවත්කාලීන කරන ලද පාස් පොත සමග එහි සහතික කරන ලද පිටපතක්.

iv.දැනට ඔබ සමිතිය විසින් ගිවිසුම් ගත ව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු. (ඒවායේ ගිවිසුම් ගත වටිනාකම්ද ඇතුළත්ය)

v.මෙම ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබා නොදෙන බවට ප්‍රජා පාදක සංවිධානය විසින් ලබා දෙන ප්‍රකාශය.

vi.ඉල්ලුම් කරන ප්‍රජා පාදක සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරු දරන අයගේ ජාතික හැඳුනුම්පත් පිටපත.

vii.ප්‍රජා පාදක සංවිධාන වල සභාපතිවරයා හෝ ලේකම්වරයාගේ දුරකථන අංක හෝ සංබන්ධ කර ගත හැකි ලිපිනයන්.

3. 2026.07.07 දින පෙ.ව.10 : 30............ ට සමිති ඇගයීම් කමිටුව පැවැත්වීමට සැලසුම් කර ඇති අතර, එම අවස්ථාවට සමිතියේ නිලධාරීන්ට හෝ නියෝජිතයෙකුට සහභාගී විය හැක.

4.ඉහත තොරතුරු ඉදිරිපත් කළ පසු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව භාණ්ඩ,වැඩ හා උපදේශන නොවන සේවා සඳහා පසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 ප්‍රකාරව අනුමත සමිති ඇගයීම සිදු කොට ඉහත කර්මාන්තයේ වැඩ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කරනු ලැබේ.

05.නියමිත කාලසීමාව ඇතුළත තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වන සමිති ඇගයීම ක්‍රියාවලිය සඳහා ඇතුළත් කර ගනු නොලැබේ.

06.අනුමත සමිති පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසන් බලය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් රැස් කරනු ලබන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව භාණ්ඩ,වැඩ හා උපදේශන නොවන සේවා සඳහා පසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 අනුව සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කමිටුව සතුවේ.

07.ඉහත කරුනු සම්බන්ධව වැඩිදුර තොරතුරු දැන ගැනීමට හෝ පැහැදිලි කර ගැනීම සඳහා රාජකාරී වේලාවන් තුළ 036-2258014 දුරකථන අංකයට ඇමතීමෙන් විෂය නිලධාරීන් වෙතින් අදාළ තොරතුරු හා පැහැදිලි කර ගැනීම සිදුකර ගැනීමට හැකියාව පවතින බව ද දන්වා සිටිමි.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

බන්ධුලසේන දුණුවිල
සභාපති
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව